පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.16 පැය 1810 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/750/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**"සිරි දළදා වන්දනාව" වෙනුවෙන් ආරක්ෂක වැඩපිළිවෙල සහ රථවාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

සිරි දළදා වන්දනාව 2025.04.18 වන දින පස්වරු 03.30 ට ආරම්භ කර එදින පස්වරු 05.30 දක්වාත්, ඉන් අනතුරුව 2025.04.19 වන දින සිට 2025.04.27 වන දින දක්වා සෑම දිනකම දහවල් 12.00 සිට පස්වරු 05.30 දක්වා මහනුවර ශ්‍රී දළදා මාළිගය පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිතය. සිරි දළදා වන්දනාව සඳහා ලක්ෂ 20 කට අධික දෙස් විදෙස් බැතිමතුන්ගේ පැමිණීම අපේක්ෂා කරනු ලබයි. එබැවින් මෙම කාලය තුළ ශ්‍රී දළදා වහන්සේගේ හා දළදා මාළිගාව අවට පරිශ්‍රයේ ආරක්ෂාව, පැමිණෙන බැතිමතුන්ගේ ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව මහජනතාව සෝදිසි කිරීම, රථ වාහන පාලනය හා මාගර් බාධක රාජකාරි යෙදවීම සිදු කරනු ලබන අතර, ඒ සඳහා රාජ්‍ය නිවේදිත නිලධාරීන් 35 ක් ඇතුළු පොලිස් නිලධරයන් 10,000 කට අධික ප්‍රමාණයක් රාජකාරි යෙදවීමට නියමිතය.

සිරි දළදා වන්දනාව සඳහා බැතිමතුන් පැමිණෙන රථ වාහන මහනුවර නගරයට පැමිණීම හේතුවෙන් නගරය තුල අනවශ්‍ය රථ වාහන තදබදයක් ඇති විය හැකි බැවින් එම තදබදය අවම කර ගැනීම සඳහා රථ වාහන මහනුවර නගරයට ඇතුල් වීම 2025.04.17 වන දින සිට සීමා කිරීමකට ලක් කරනු ලැබේ.

සිරි දළදා වන්දනාව සඳහා බැතිමතුන් පැමිණෙන රථ වාහන පහත සඳහන් ස්ථානයන්හි ගාල් කිරීමට කටයුතු කර බැතිමතුන්ගේ පහසුව සඳහා එම ස්ථානවල සිට සහන ගාස්තුවක් යටතේ විශේෂ බස් රථ සේවා මඟින් ශ්‍රී දළදා මාළිගාව දක්වා ප්‍රවාහනය කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇත.

- ගම්පොල හා කොළඹ දෙස සිට පැමිණෙන වාහන ගැටඹේ හන්දියෙන් නවත්වා එම වාහන ගැටඹේ ක්‍රීඩාංගනයේ හා ගන්නෝරුව මාගර්යේ නවතා තැබීමට කටයුතු සලස්වා ඇත.
- කුරුණෑගල කටුගස්තොට මාගර්ය දෙසින් පැමිණෙන වාහන 4 කණුව අසල නවතා තැබීමට කටයුතු සලස්වා ඇත.
- මඩවල මාගර්යේ පැමිණෙන වාහන පොල්ගොල්ල මහින්ද රාජපක්ෂ රඟහල් භූමියේ නවතා තැබීමට කටයුතු සලස්වා ඇත.
- මාතලේ මාගර්යෙන් පැමිණෙන වාහන රාකඩේ හන්දියෙන් ධම්රාශෝක මාවතේ නැවැත්වීමට පහසුකම් සලසා දී ඇති අතර සැහැල්ලු වාහන පී.ටී රාජන් ක්‍රීඩාංගනයේ නවතා තැබීමට කටයුතු සලස්වා ඇත.

- මහියංගනය (18 වංගුව) දෙස සිට පැමිණෙන වාහන පල්ලෙකැලේ බණ්ඩාරණායක විද්‍යාල ක්‍රීඩාංගනයේ නවතා තැබීමට කටයුතු සලස්වා ඇත.

- බදුල්ල දෙස සිට පැමිණෙන වාහන ගුරුදෙණිය ප්‍රදේශයේ නවතා තැබීමට කටයුතු සලස්වා ඇත.

එමෙන්ම මහනුවර නගරය හරහා ධාවනය කරනු ලබන දුර ගමන් බස් සේවා හා මහනුවර නගරයෙන් ආරම්භ වන ගමන් සේවා බස් රථ එලෙසම ක්‍රියාත්මක වන අතර එම බස් රථ YMBA අසල රජපිහිල්ල බස් රථ ගාල හා බෝගම්බර ක්‍රීඩාංගනය ඉදිරිපිට පමණක් නවතා තැබීමට කටයුතු කරනු ලබයි. තවද කෙටි ගමන්වාර බස් රථ නගරය තුළ නවතා තැබීමට අවසර ලබා දෙනු නොලැබේ.

**සිරි දළදා වන්දනාව පැවැත්වෙන කාල සීමාව තුළ මහනුවර නගරය හරහා පැමිණෙන වාහන සඳහා පහත විකල්ප මාගර් භාවිතා කළ හැක.**

- කුරුණෑගල, මාතලේ මාගර්වල සිට මහනුවර නගරය හරහා කොළඹ, නුවරඑළිය දෙසට ගමන් කරන වාහන කටුගස්තොට පාලම අසලින් ගොහාගොඩ මාගර්ය ඔස්සේ පේරාදෙණිය දෙසට ගමන් කර කොළඹ සහ නුවරඑළිය දෙසට ගමන් කල හැකිය.

- කොළඹ නුවර මාගර්යේ සහ නුවරඑළිය දෙස සිට කුරුණෑගල මාතලේ මහියංගනය දෙසට ගමන් කරන වාහන පේරාදෙණිය ගොහාගොඩ මාගර්යෙන් පැමිණ කුරුණෑගල, මාතලේ සහ මඩවල හරහා මහියංගනය දෙසට ගමන් කල හැක.

- බදුල්ල දෙසට ගමන් කරන වාහන මහයියාව බිංගෙය අසලින් ධමර්ාශෝක මාවත ඔස්සේ තැන්නේකුඹුර හරහා බදුල්ල දෙසට ගමන් කළ හැක.

**තම දෛනික අවශ්‍යතා සඳහා මහනුවර නගරය වෙත පැමිණෙන මහජනතාවගේ වාහන නගරයේ නවතා තැබීමට අවසර ලබා නොදෙන බැවින් එම වාහන නවතා තැබීම සඳහා පහත රථ ගාල් භාවිතා කළ හැක.**

- වේවැල්පිටිය ක්‍රීඩාංගනය අසල රථ ගාල - සැහැල්ලු වාහන
- සහස් උයන රථගාල - සැහැල්ලු වාහන
- ගැටඹේ මහානාම ක්‍රීඩාංගනය- සැහැල්ලු වාහන
- මහයියාව සුසාන භූමිය ඉදිරිපිට- බස් රථ
- ධමර්ාශෝක මාවත මහ වංගුවේ සිට ජපන් කඩේ හන්දිය දක්වා මාගර්ය- බස් රථ
- KMC රථගාල -සැහැල්ලු වාහන
- YMBA අසල රජපිහිල්ල බස් රථ ගාල- බස් රථ
- කරලිය රථගාල- සැහැල්ලු වාහන
- බෝගම්බර බන්ධනාගාරය ඇතුළත - බස් රථ
- බෝගම්බර ක්‍රීඩාංගනය - බස් රථ
- තැන්නේකුඹුර හන්දියේ සිට හාරගම මාගර්යේ වම්පස - බස් රථ
- SWRD බණ්ඩාරනායක මාවත- බස් රථ

සිරි දළදා වන්දනාව **පැවැත්වෙන කාල සීමාව තුළ පහත ස්ථාන වල මාගර් බාධක යොදවා ඇත .**

- විලියම් ගොපල්ලව මාවත හීරස්සගල හන්දිය
- සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ගැටඹේ ක්‍රීඩාංගණයේ ගේට්ටුව අසල
- අම්පිටිය රතු බෝක්කුව අසල

- ❖ මහියියාව වේවැල්පිටිය ක්‍රීඩාංගණය අසල
- ❖ ලේවැල්ල පාලම
- ❖ තැන්නකුඹුර මාගර් බාධකය
- ❖ කටුගස්තොට පාලම අසල
- ❖ කඩුගන්නාව මාගර් බාධකය
- ❖ දොඩම්වල පාලම අසල
- ❖ හන්තාන පාර IFS ආයතනය අසල
- ❖ පොල්ගොල්ල වේල්ල අසල
- ❖ බෝතලාපිටිය මාගර් බාධකය
- ❖ බලකඩුව මාගර් බාධකය
- ❖ දිගන හන්දිය

සිරි දළදා වන්දනාව සඳහා බැතිමතුන් පැමිණීමේදී සුදු වතින් සැරසී පැමිණෙන ලෙසත්, විශාල ප්‍රමාණයේ ගමන්මළු, කැමරා, වීඩියෝ උපකරණ හා අනෙකුත් විද්‍යුත් උපකරණ ශ්‍රී දළදා මාලිගාව වෙත රැගෙන ඒමෙන් වළකින ලෙස පොලිසිය බැතිමතුන්ගෙන් ඉල්ලා සිටී

සිරි දළදා වන්දනාව සඳහා පැමිණෙන බැතිමතුන්ගේ ආරක්ෂාව හා රථ වාහන පාලනය වෙනුවෙන් යොදවා ඇති පොලිස් නිලධාරීන්ගේ සහය සඳහා පොලිස් විශේෂ කාර්‍ය බලකා නිලධාරීන්, පොලිස් නිල සුනඛ අංශය, ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාවේ නිලධාරීන්ද රාජකාරී සඳහා යොදවා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**